සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# ගිණුම්කරණය - I

**12 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

<u>උපදෙස්:-</u>

- ප්‍රශ්න අංක 01 සිට 30 දක්වා නිවැරදි පිළිතුරේ අංකය තෝරා තිත් ඉරි මත ලියන්න.
- අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකට ම ලකුණු 04 බැගින් හිමි වේ.

---

01. P, Q, R යන ව්‍යාපාරවල මූල්‍ය අගයන් පිළිවෙලින් A, B සහ C වශයෙන් සඳහන් කර ඇති තැන්වල වටිනාකමක් නොමැතිව පහත දක්වා ඇත.

| ව්‍යාපාරය | හිමිකරුවන්ගේ ස්කන්ධය රු. | වත්කම් රු. | වගකීම් රු. |
|---|---|---|---|
| P | A | 350,000 | 300,000 |
| Q | 25,000 | B | 150,000 |
| R | 60,000 | 100,000 | C |

A, B සහ C වශයෙන් සඳහන් කර ඇති තැන්වල පිළිවෙලින් තිබිය යුතු අගයන් වන්නේ,

(1) A = රු. 650,000/ B = රු. 125,000/ C = රු. 160,000/ ය.

(2) A = රු. 50,000/ B = රු. 175,000/ C = රු. 40,000/ ය.

(3) A = රු. 650,000/ B = රු. 175,000/ C = රු. 40,000/ ය.

(4) A = රු. 50,000/ B = රු. 125,000/ C = රු. 40,000/ ය.

(5) A = රු. 50,000/ B = රු. 100,000/ C = රු. 60,000/ ය.

(.........)

02. ගණුදෙනු සටහන් කිරීම සඳහා පොදු ජ'නලය පාවිච්චි නොකරන්නේ පහත සඳහන් ඒවායින් කුමක් ද?

(1) ණයට භාණ්ඩ විකිණීමේදී

(2) දෝෂ නිවැරදි කිරීමේදී

(3) ජංගම නොවන වත්කම් ණයට මිලදී ගැනීමේදී

(4) ක්ෂය ප්‍රතිපාදන කිරිමේ දී

(5) අඩමාණ ණය වෙන් කිරීමේ දී

(.........)

03. සමිත හිරු වෙළෙඳ සමාගම තෑගි භාණ්ඩ මිලට ගෙන අලෙවි කිරීමේ ව්‍යාපාරයක යෙදී සිටී. 2015 අප්‍රේල් 01 දිනට සමාගමේ බැංකු ශේෂය රු. 250,000 ක් විය. අප්‍රේල් මාසය තුළදී රු. 12,000 ක ඉන්වොයිසියක් සඳහා 10% ක මුදල් වට්ටමකට යටත්ව ණය ගැතියෙකුගෙන් චෙක් පතක් සමාගමට ලැබුණි. තවද 15%ක වෙළඳ වට්ටමකට හා 7.5%ක මුදල් වට්ටමකට යටත්ව රු. 40,000 කට ඉන්වොයිස් කරන ලද මිලට ගැනීම් සඳහා චෙක් පතක් සමාගම විසින් ගෙවන ලදී.

අප්‍රේල් අවසානයේ බැංකු ශේෂය වූයේ,

(1) රු. 230,550 (2) රු. 229,350 (3) රු. 226,800

(4) රු. 221,800 (5) රු. 262,800 (.........)

04. මුල්‍ය ප්‍රකාශන තුළ ''විශ්වාසදායී බව'' ආරක්ෂා වීම සඳහා පහත ගිණුම්කරණ කටයුතු වලින් කුමක් ඉවහල් වන්නේ ද?

A මුල්‍යවාර්තා වල වගකීම භාර ගෙන එහි කළමණාකාරීත්වය අත්සන් තැබීම.

B ගිණුම්වාර්තා විගණනයට භාජනය කිරීම.

C ව්‍යාපාරයේ තොග ගණනය කර මුල්‍යවාර්තා වල තොගය දැක්වීම

D ප්‍රමාණවත් සාක්ෂි පදනම් කර ගෙන ලබාගත් තොරතුරු ඔස්සේ පමණක් ගිණුම්වාර්තා ගොඩනැගීම.

(1) A D පමණි (2) A B D පමණි (3) B C D පමණි

(4) A හා D පමණි (5) A B C D යන සියල්ලම (.........)

05. පහත සඳහන් වන්නේ ගිණුම්කරණ යෙදුම් කිහිපයකි.

(A) 2015 ලද විකුණුම් ඇණවුමක් වූ රු. 150,000 ක මුදල් ලැබී නැතත් 2015 විකුණුම් ලෙසට හඳුනා ගැනීම

(B) මුදලින් ගෙවූ ගෙවල් කුලී රු. 40,000 ක් වුවත් ලාභාලාභ ගිණුමට ගෙවල් කුලී රු. 50,000ක් ගැනීම

(C) ඵලදායි ජීවිත කාලය වර්ෂ 03 ක් වුවත් කුඩා උපකරණ මිලදී ගත් රු. 4000 ක් ලාභාලාභ ගිණුමට ගැනීම

(D) ගිණුම්කරණ නිර්දේශ වලට අනුකූල වන පරිදි LIFO ක්‍රමයට ගණනය කළ තොග FIFO ක්‍රමයට වෙනස් කිරීම.

(E) ව්‍යාපාරයට විරුද්ධව පවරා ඇති නඩුවක් වෙනුවෙන් සිදුවිය හැකි වන්දි ගෙවීමක් ලෙසට රු. 50,000 ක් ලාභයෙන් වෙන් කිරීම.

ඉහත එකිනෙක පද වලට සම්බන්ධ වන සංකල්ප ඇතුලත් වාක්‍ය පෙළ තෝරන්න.

| | A | B | C | D | E |
|---|---|---|---|---|---|
| (1) | උපචිත | ගැලපුම් | ගැලපුම් | ආරක්ෂණය | ගැලපුම් |
| (2) | උපලබ්ධි | උපචිත | ආරක්ෂණය | ගැලපුම් | ආරක්ෂණය |
| (3) | උපචිත | ගැලපුම් | ප්‍රමාණාත්මකතාව | අනුරූපීතාවය | උපචිත |
| (4) | ආරක්ෂණය | මුල්‍ය මිණුම් | ගැලපුම් | ආරක්ෂණය | උපචිත |
| (5) | උපලබ්ධි | උපචිත | ප්‍රමාණාත්මකතාව | අනුරූපීතාවය | ආරක්ෂණය |

(.........)

06. සමාගමක් රු. 100,000 වටිනාකමක් දැක්වූ භාණ්ඩ තොගයක් ගණුදෙනුකරුවෙකුට 20% වෙළෙඳ වට්ටමකට යටත්ව හා 12% ක VAT අනුපාතයකට යටත්ව ණයට විකුණන ලද අතර තබන ලද ද්විත්ව සටහන වූයේ රු. 100,000 ක් ණයගැති ගිණුම හර කර විකුණුම් ගිණුමට බැර කිරීමයි. මෙම වරද නිවැරදි කිරීමට කළ යුතු සටහන් වන්නේ,

(1) විකුණුම් හර 20,000
ණයගැතියෝ බැර 20,000

(2) ණයගැතියෝ හර 12,000
VAT බැර 12,000

(3) ණයගැතියෝ හර 9,600

VAT බැර 9,600

(4) විකුණුම් හර 20,000

VAT බැර 9,600

ණයගැතියෝ බැර 10,400

(5) විකුණුම් හර 10,400

ණයගැතියෝ බැර 10,400

(.........)

07. සීමිත වදුවල සමාගම පහත තොරතුරු ලබා දේ

- අමුද්‍රව්‍ය ඒකක 20,000 ක් ඒකකයක් රු. 5/ බැගින් මිලට ගැනීම.
- ආයාත බදු සහ අයකරගත නොහැකි බදු රු. 16,000/
- නිෂ්කාශණ ගාස්තු රු. 8,000/
- රැගෙන ඒමේ පිරිවැය රු. 5,000/
- වෙළඳ වට්ටම 5% කි.
- මෙම නිෂ්පාදනය දිරිමත් කිරීමට රජය විසින් ආනයනය කළ ඒකකයකට රු. 1/ බැගින් සහනාධාරයක් ලබා දේ.

ඉහත තොරතුරු මත මිලදී ගැනීම් පිරිවැය,

(1) රු. 102,550/ (2) රු. 109,000/

(3) රු. 129,000/ (4) රු. 100,000/

(5) රු. 104,000/ (.........)

08. ව්‍යාපාරයක සුළු මුදල් තොරතුරු පහත ලෙසට සපයා ඇත.

| මාසය | | වටිනාකම | විස්තරය |
|---|---|---|---|
| 2015 | මාර්තු | 150 | මාසය අවසාන දිනට වූ ශේෂය |
| | මාර්තු | 200 | මාසය තුළ නැතිවූ ශේෂය |
| | මාර්තු | 1650 | වියදම් සඳහා ගෙවූ මුළු මුදල |

සුළු මුදල් අග්‍රිමය කොපමණ ද? 2015 අප්‍රේල් 01 දිනට ප්‍රතිපූර්ණය කළ යුතු මුදල් ප්‍රමාණය කොපමණ ද?

(1) රු. 1800 හා රු. 1650

(2) රු. 1650 හා රු. 150

(3) රු. 2000 හා රු. 1650

(4) රු. 2000 හා රු. 1850

(5) රු. 1850 හා රු. 1650 ලෙසට ය. (.........)

09. "Z" ගේ ව්‍යාපාරයේ පහත තොරතුරු ලබාදේ.

| අයිතමය | පොත්වලට අනුව ශේෂය (ඒකක) | භෞතික ශේෂය (ඒකක) | ඒකක පිරිවැය | ඒකක ශුද්ධ උපලබ්ධි අගය |
|---|---|---|---|---|
| A | 40 | 40 | 10 | 20 |
| B | 50 | 40 | 12 | 10 |

ඉහත තොරතුරු මත තොගයේ අගය

(1) 480 (2) 1000 (3) 800 (4) 400 (5) 880 (.........)

10. ව්‍යාපාරයක ණයගැතියන්ට අදාළව පහත තොරතුරු ලබා දේ.

| | (රු. 000 ) |
|---|---|
| 2015 01 01 දිනට ශේෂය | 3.5 |
| ණයට විකුණුම් | 250 |
| ණයගැතියන්ගෙන් ලද මුදල | 225 |
| විකුණුම් ආපසු හරවා එවුම් | 2.5 |
| අයකරගත නොහැකි ණයගැති මුදල | 3 |
| ණයගැති, ණයහිමි හිලව්කිරීම් | 4 |

2015 03 31 දිනට ණයගැති පාලන ගිණුමට අනුව ශේෂය,

(1) රු. 12,000 (2) රු. 19,000 (3) රු. 22,000

(4) රු. 25,000 (5) රු. 27,000 (.........)

11. අමිදුගේ ව්‍යාපාරයේ වෙළෙඳ ගිණුමෙන් උපුටාගත් තොරතුරු කිහිපයක් පහත වේ.

විකුණුම් රු. මිලියන 1 කි.

ගැණුම් රු. මිලියන 0.6 කි.

ව්‍යාපාරයේ විකුණුම් මත දළ ලාභ අනුපාතය 40% කි.

ඉහත ව්‍යාපාරයේ අවසාන තොගය,

(1) ආරම්භක තොගයට වඩා රු. 400,000 ක් අඩුය.

(2) ආරම්භක තොගයට වඩා රු. 200,000 ක් වැඩිය.

(3) ආරම්භක තොගයට වඩා රු. 200,000 ක් අඩුය.

(4) ආරම්භක තොගයට සමාන වේ.

(5) ආරම්භක තොගයට වඩා රු. 400,000 ක් වැඩිය. (.........)

12. MDK ව්‍යාපාරයට අදාළව පහත තොරතුරු ලබා දේ.

| මාර්තු 31 දිනට | 2014 | 2015 |
|---|---|---|
| අමුද්‍රව්‍ය | 45 | 75 |
| අර්ධ නිමි තොගය | 70 | 60 |
| නිමි භාණ්ඩ තොගය | 90 | 100 |

2015 03 31 න් අවසන් වසරට අදාළ තොරතුරු

- ⋆ අමුද්‍රව්‍ය මිලදී ගැණුම් වල වටිනාකම රු. 150,000 කි.
- ⋆ නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ වූ ඍජු ශ්‍රමිකයන්ට ගෙවූ වැටුප රු. 50,000 කි.
- ⋆ නිෂ්පාදන පොදුකාර්ය වියදම් වල වටිනාකම රු. 40,000 කි.
- ⋆ නිෂ්පාදන නොවන පොදුකාර්ය වියදම් වල වටිනාකම රු. 10,000 කි.

ඉහත තොරතුරු වලට අනුව ව්‍යාපාරයේ ප්‍රාථමික පිරිවැය කොපමණ ද?

(1) රු. 220,000 (2) රු. 230,000 (3) රු. 180,000

(4) රු. 170,000 (5) රු. 210,000 (.........)

The National e-learning Portal for The General Education

13. ඉහත MDK ව්‍යාපාරය 2015 03 31 න් අවසන් වසර තුළ දී ඉපැයූ දළ ලාභ අනුපාතිකය විකුණුම් මිල මත 20% ක් නම්, ව්‍යාපාරයේ මුළු විකුණුම් වල වටිනාකම,

(1) රු. 275,000 (2) රු. 262,500 (3) රු. 225,000

(4) රු. 237,500 (5) රු. 333,333 (.........)

14. සමන් සමාගම 2015 ජනවාරි මාසයට අදාළව පහත තොරතුරු ලබා දේ.

| දිනය | ලැබීම් (ඒකක) | ඒකකයක පිරිවැය | නිකුත් කිරීම් (ඒකක) |
|---|---|---|---|
| ජනවාරි 01 ශේෂය | 1000 | 5 | |
| ජනවාරි 10 | 700 | 7 | |
| ජනවාරි 15 | | | 1100 |
| ජනවාරි 20 | 1000 | 9 | |
| ජනවාරි 30 | | | 900 |

ඉහත තොරතුරු මත 205 ජනවාරි මාසයට අදාළව විකුණුම් පිරිවැය ( FIFO ක්‍රමය අනුගමනය කරයි.)

(1) රු. 9,900 (2) රු. 14,000 (3) රු. 10,000

(4) රු. 13,500 (5) රු. 12,600 (.........)

15. ලහිරුගේ ව්‍යාපාරයේ ගිණුම් සැකසීමේදී පහත වැරදි සිදුවී ඇත.

(i) දුන් වට්ටම් තීරුවේ එකතුව රු. 4,000 ක් අඩුවෙන් එකතු කර ඇත.

(ii) 2015 03 31 දිනට තොගයේ පිරිවැය රු. 30,000 කි. එහි ශුද්ධ උපලබ්ධි අගය රු. 48,000 කි. ආදායම් ප්‍රකාශයට තොග ලෙස ගෙන ඇත්තේ ශුද්ධ උපලබ්ධි අගය වේ.

(iii) උපචිත ණය පොලී රු. 3,000 පිළිබඳව කිසිදු සටහනක් පොත් වල සිදුකර නැත.

ඉහත වැරදි නිවැරදි කළ පසු ලාභයට වන බලපෑම,

(i) රු. 25,000 ක් අඩුවේ. (ii) රු. 19,000 ක් අඩුවේ.

(iii) රු. 19,000 ක් වැඩි වේ. (iv) රු. 25,000 ක් වැඩි වේ.

(v) රු. 40,000 ක් අඩු වේ.

16. ව්‍යාපාරයක 2015 01 01 දිනට ප්‍රාග්ධනය රු. 100,000 ක් සහ රු. 80,000 ක වගකීමක් තිබුණි.

(i) බොල්ණය රු. 5,000 පොත්වලට සටහන් කිරීම.

(ii) අඩමාණ ණය වෙන් කිරීමේ ගිණුමේ ශේෂය රු. 4,000 කින් වැඩි කිරීම.

(iii) ඉහත (1), (2) සටහන් කළ පසු වත්කම් වල අගය,

(1) රු. 171,000 (2) රු. 176,000 (3) රු. 181,000

(4) රු. 175,000 (5) රු. 189,000 (.........)

17. ව්‍යාපාරයක පහත තොරතුරු ලබා දේ,

(i) ආරම්භක තොගයෙහි වටිනාකම රු. 50,000 කි.

(ii) අවසාන තොගයෙහි වටිනාකම රු. 35,000 කි.

(iii) වසර තුළ සිදුකළ විකුණුම් වලින් උපයා ගත් දල ලාභය රු. 60,000

(iv) ව්‍යාපාරය පිරිවැය මත 20% ක ලාභයක් තබාගෙන භාණ්ඩ විකුණයි.

ඉහත තොරතුරු මත කාලච්ඡේදය තුළ සිදුකළ ගැණුම් වටිනාකම,

(1) රු. 308,000 (2) රු. 303,000 (3) රු. 273,000

(4) රු. 285,000 (5) රු. 315,000

18. LKAS 02 ට අනුව තොගය අගය කළ යුත්තේ,

(1) පිරිවැයටය. (2) ශුද්ධ උපලබ්ධිත අගයටය (3) පසුව උපලබ්ධිත අගයටය

(4) පිරිවැය හා ශුද්ධ උපලබ්ධිත අගයන් 2 න් වඩාත් වැඩි වටිනාකමටය.

(5) පිරිවැය හා ශුද්ධ උපලබ්ධිත අගයන් 2 න් වඩාත් අඩු වටිනාකමටය. (.........)

19. චමින්ද මහතාගේ ව්‍යාපාරයේ රථ වලට අදාළව පහත තොරතුරු ලබාදේ. (2014. 03. 31)

මෝටර් රථ 1,000,000

ක්ෂය වෙන් කිරීම 400,000

මෝටර් රථ පිරිවැය මත 10% ක් ක්ෂය කරයි.

ව්‍යාපාරය 2014 / 09/ 01 දින රු. 600,000 කට මිලට ගත් රථයක් 2014. 09. 30 දින විකුණන ලදී.

ඉහත තොරතුරු මත 2015. 03. 31 දිනට ක්ෂය වෙන් කිරීම් ගිණුමේ ශේෂය

(1) රු. 185,000 (2) රු. 285,000 (3) රු. 51,500

(4) රු. 315,000 (5) රු. 400,000 (.........)

20. සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයකට සාමාන්‍යයෙන් ඇතුලත් වන්නේ,

(1) මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ගිණුම් සටහන්

(2) මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, ආදායම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය, ගිණුම් සටහන්.

(3) මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, ආදායම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, සභාපතිගේ ප්‍රකාශය

(4) ආදායම් ප්‍රකාශය, අධ්‍යක්ෂකගේ වාර්තාව, සභාපතිගේ ප්‍රකාශය

(5) ඉහත කිසිවක් නොවේ. (.........)

21. සීමිත AXY ව්‍යාපාරය වසර තුළදී රු. 500,000 ශුද්ධ අගයන් සහිත වත්කමක් හුවමාරු කර රු. 800,000 ක් වන වත්කමක් ලබාගන්නා ලදී. ඉතිරිය මුදලින් ගෙවන ලදී.

ඉහත ගණුදෙනු සටහන් කළ යුත්තේ (රු. 000)

| | වත්කම් | හිමිකම් | වගකීම් |
|---|---|---|---|
| (1) | 800<br>+500 | 300 | |
| (2) | +800<br>500 | +300 | |
| (3) | +800<br>500 | | +300 |
| (4) | 300 | 300 | |
| (5) | 300<br>+800<br>500 | | |

(.........)

22. සීමිත Apple සමාගම පහත තොරතුරු ලබා දේ. (රු. '000)

| | |
|---|---|
| අවසාන නිමි ඒකක වලට වඩා ආරම්භක ඒකකවල වැඩිවීම | 10 |
| වසරේ නිමකළ භාණ්ඩවල මුළු නිෂ්පාදන පිරිවැය රු. | 144 |
| වසර තුළ විකුණුම් ඒකක සංඛ්‍යාව | 60 |
| <u>අයිතිකරු තම පුද්ගලික ප්‍රයෝජනයට ගත්</u> | |
| අමුද්‍රව්‍ය ඒකක | 5 |
| නිමි භාණ්ඩ ඒකක | 2 |

ඉහත තොරතුරු මත වසර තුළ.

| | වසර තුළ නිපදවූ ඒකක සංඛ්‍යාව | ඒකක නිෂ්පාදන පිරිවැය රු. |
|---|---|---|
| (1) | 72,000 | 2 |
| (2) | 50,000 | 2.88 |
| (3) | 52,000 | 2.76 |
| (4) | 59,000 | 2.44 |
| (5) | 70,000 | 2.05 |

(...........)

23. පහත සඳහන් වන්නේ ගිණුම්කරණ ප්‍රකාශන සඳහා සත්‍ය ''√ '' හා අසත්‍ය '' X '' ලකුණ ලෙස දී ඇති පිළිතුරයි. වඩාත් නිවැරදි පිළිතුරු ඛාණ්ඩය තෝරන්න.

| | ප්‍රකාශන | | | |
|---|---|---|---|---|
| | වියදමක් මුදලින් ගෙවූ විට හඳුනාගනී | ආදායමින් සිද්ධිය හටගත් විට හඳුනාගනී | විචක්ෂණය තුළින් ලාභ අධිතක්සේරු වේ. | ගිණුම්කරණ ප්‍රතිපත්තිය කිසිසේත් වෙනස් කළ නොහැක. |
| (1) | √ | √ | X | √ |
| (2) | X | √ | √ | X |
| (3) | √ | X | X | √ |
| (4) | √ | X | √ | X |
| (5) | X | √ | X | X |

(...........)

24. පහත සඳහන් ප්‍රකාශන අතරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(A) දිගුකාලීන වත්කම් හඳුනාගැනීමට අඛණ්ඩ පැවැත්ම සංකල්පය බලපායි.

(B) තොගවල පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධිත අගයෙන් අඩු අගය තෝරාගැනීමට ගැලපුම් සංකල්පය බලපායි.

(C) ක්ෂය වීම කෙරෙහි උපචිත සංකල්පය බලපායි.

(D) මුල්‍ය මිණුම් සංකල්පයය නිසා අදාළ බව පිළිබඳ විඥාපන ගුණාංගය කඩ වේ.

(E) LIFO සිට FIFO ක්‍රමයට තොග මිල කිරීමේ ක්‍රමය මාරු කිරීමට අනුරූපිතා සංකල්පය කඩවීමක් සිදුවේ.

(1) A, B, D පමණි. (2) A හා B පමණි. (3) A, B, D, E පමණි.

(4) A, D, E පමණි. (5) A හා D පමණි. (..........)

25. ව්‍යාපාරවල භාවිත වන ගිණුම් කිහිපයක් පහත දැක්වේ.

(i) ගැනිලි (ii) ක්‍ෂය වෙන්කිරීම (iii) ලැබිය යුතු රක්‍ෂණ වන්දි (iv) හානි වූ තොග

(v) කලින් ගෙවූ රක්‍ෂණය (vi) ලද පොළී

පහත ගිණුම් වර්ගීකරණය අනුව නිවැරදි වන්නේ කුමක්ද?

| | වත්කම් | වගකීම් | හිමිකම් |
|---|---|---|---|
| 01. | ③, ④ | ②, ⑤ | ①, ⑥ |
| 02. | ②, ③, ⑤ | | ①, ④, ⑥ |
| 03. | ①, ③ | ②, ④, ⑤ | ⑥ |
| 04. | ②, ③, ⑤, ⑥ | | ④, ① |
| 05. | ②, ③, ④ | ⑤ | ①, ⑥ |

(.........)

26. හිමිකම් වැඩිවේ සහ හිමිකම් අඩුවේ. $(c^{+} = c^{-})$ වර්ගයේ ගණුදෙනුවක් වන්නේ,

(1) අයිතිකරු පෞද්ගලික මුදලින් ණය හිමියන්ට ගෙවීමක්.

(2) අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට භාණ්ඩ ගෙන යෑමක්.

(3) ණය ගැතියන්ගෙන් ලද මුදලින් අයිතිකරු පෞද්ගලිකව රැස්කර ගැනීමක්.

(4) හවුල් ව්‍යාපාරයක ලාභයෙන් ප්‍රාග්ධන පොලී වෙන් කිරීමක්.

(5) අයිතිකරු පෞද්ගලික බැංකු ණය මුදලක් ව්‍යාපාරයෙන් ගෙවීමක්.

(.........)

The National e-learning Portal for the General Education

27. ව්‍යාපාරයක 2010. 12. 31 න් අවසන් වර්ෂයේ පහත ගණුදෙනු සිද්ධි පිළිබඳව ද්විත්ව සටහන් තබා තිබේ.

| | | | හර | බැර |
|---|---|---|---|---|
| (A) | ණයගැතියෝ | හර | 150,000 | |
| | විකුණුම් | | | 150,000 |
| | (ලද විකුණුම් ඇනවුමක් සටහන් කිරීම) | | | |
| (B) | ගැණුම් | හර | 80,000 | |
| | වට්ටම් | හර | 20,000 | |
| | ණයහිමියෝ | | | 100,000 |
| | (20% වෙළෙඳ ණය හිමියෝ වට්ටම් යටතේ භාණ්ඩ ණයට ගැනීම.) | | | |
| (C) | ණයගැතියෝ | හර | 120,000 | |
| | විකුණුම් | | | 100,000 |
| | VAT | | | 20,000 |
| | (20% VAT භාණ්ඩ ණයට විකිණීම) | | | |
| (D) | ආපසු එවුම් | හර | 10,000 | |
| | ණයගැතියෝ | | | 10,000 |
| | (විකිණීම හෝ ආපසු එවීම යටතේ යැවූ භාණ්ඩ ආපසු එවීම.) | | | |

ඉහත සටහන් වලින් ගිණුම්කරණයට අනුව නිවැරදි සටහන් වන්නේ,

(1) A, C හා D පමණි. (2) C හා D පමණි (3) A හා D පමණි

(4) C පමණි (5) D පමණි (.........)

28. තුෂාර වෙළෙඳ ව්‍යාපාරය ස්ථාන 3 ක් කුලියට ගෙන ඇති අතර, කුලී පිළිබඳ විස්තර පහත දැක්වේ. ගිණුම්වලට 2010. 12. 31 න් අවසන් වන වර්ෂයකි.

| ව්‍යාපාර ස්ථානය | | කුලී පිළිබඳ විස්තරය |
|---|---|---|
| ( i ) | නුගේගොඩ ව්‍යාපාරය | මාසික කුලිය රු. 10,000 සෑම වර්ෂයකම ජූලි 01 වන දින ඉදිරි වර්ෂයට කුලී ගෙවයි |
| (ii) | මහරගම ව්‍යාපාරය | 2010/04/01 දින කුලියට ගන්නා ලදී. එදින සිට ඉදිරි වර්ෂයට රු. 240,000 කුලී ලෙස ගෙවා ඇත. |
| (iii) | කොළඹ කොටුව ව්‍යාපාරය | 2009 ඔක්තෝබර් 01 දින ඉදිරි වර්ෂයට කුලී ගෙවා ඇත. මුළු ගෙවීම් රු. 360,000 කි. ඉන් පසු කුලී ගෙවා නැත. නමුත් කුලී ගිවිසුම අනුව එය අළුත් කිරීමේ දී 50% කුලී වැඩිවීමක් කළ යුතුය. |

2010/12/31 න් අවසන් වර්ෂයේ ලාභාලාභ ගිණුමට ගන්නා කුලිය සහ ඉදිරියට කළ කුලිය වන්නේ,

| | ලාභාලාභ ගිණුම රු. | ඉදිරියට කළ කුලිය රු. |
|---|---|---|
| (1) | 820,000 | 60,000 |
| (2) | 900,000 | 120,000 |
| (3) | 705,000 | 60,000 |
| (4) | 705,000 | 120,000 |
| (5) | 900,000 | 180,000 |

(.............)

29. දිනේෂ් ව්‍යාපාරය 2015.12.30 මිලට ගත් රු. 15,000 ක් වටිනා මාර්ගස්ථව පැවති භාණ්ඩ තොගයක් රිය අනතුරක් නිසා විනාශයට පත්විය. පාඩුවෙන් 75%ක් රක්ෂණ සමාගම පියවීමට එකඟවන ලදී. මෙම ගණුදෙනුව නිසා ව්‍යාපාරයේ 2015.12.31 න් අවසන් වසරේ ශුද්ධ ලාභයට වන බලපෑම කොපමණද?

(මෙම තොගය අවසන් තොග ගණනයේ දී ඇතුලත් කර ඇත.)

(1) ලාභය 3 750 කින් අඩුවේ. (2) ලාභය 18 750 කින් අඩුවේ. (3) ශුද්ධ ලාභයට බලපෑමක් නැත.
(4) ලාභය 11 250 කින් වැඩිවේ. (5) ලාභය 3 750 කින් වැඩිවේ.

(.............)

30. නාලකගේ ව්‍යාපාරයේ,

| |
|---|
| කාරක ප්‍රාග්ධනය රු. 400 කින් වැඩිවිය. |
| ජංගම වගකීම් රු. 800 කින් වැඩිවිය. |

ඉහත තොරතුරු මත ජංගම වත්කම්,

(1) රු. 400 කින් වැඩි වේ. (2) රු. 800 කින් අඩු වේ. (3) රු. 800 කින් වැඩිවේ.
(4) රු. 1200 කින් අඩු වේ. (5) රු. 1200 කින් වැඩි වේ.

ප්‍රශ්න අංක 31 සිට 50 දක්වා කෙටි පිළිතුරු සපයන්න.

31. ව්‍යාපාරයක 2015/03/31 න් අවසන් වර්ෂයේ ගැණුම් හා විකුණුම් පිළිබඳව තොරතුරු පහත දැක්වේ. මේවා දක්වා ඇත්තේ VAT සහිත අගයට වන අතර, අදාළ VAT අනුපාතය 15% කි.

| | |
|---|---|
| විකුණුම් | රු. 1,150,000 |
| ගැණුම් | රු. 575,000 |

මීට අමතරව වර්ෂය තුළදී 20% VAT සහිතව මෝටර් රථයක් මිළදී ගෙන ඇති අතර VAT සහිත අගය රු. 600,000 කි.

- වෙළඳ ගිණුමට ගන්නා ගැණුම් වල අගය..........................................
- වෙළඳ ගිණුමට ගන්නා විකුණුම් වල අගය........................................
- 2015/03/31 න් අවසන් වර්ෂයේ VAT බදු ගිණුමේ ආදායම් බදු දෙපාර්තමේන්තුවට යැවිය යුතු හෝ අය කර ගත යුතු ශුද්ධ මුදල කීයද?.............................................................

32. මුදල් පොත ඉටු කරන ද්විත්ව කාර්යය කුමක්ද?

(1) ....................................................................................................

(2) ....................................................................................................

33. ගෘහ භාණ්ඩ අලෙවිකරණ සමාගමකට අදාළව නිමි, නොනිමි හා අමුද්‍රව්‍ය තොග සඳහා උදාහරණය බැගින් දෙන්න.

....................................................................................................

....................................................................................................

....................................................................................................

34. ව්‍යාපාරයක ගණුදෙනු හා සිද්ධීන් වල මූල්‍ය ප්‍රතිඵලයක් මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන්නේ ඒවා පුළුල් ලෙස වර්ග කිරීමෙනි. මෙවැනි වර්ගීකරණයන් 5 දක්වන්න.

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

35. තොගයක පිරිවැය හා ශුද්ධ උපලබ්ධිත අගයෙන් අඩු අගය නිශ්චය කිරීම සඳහා භාවිතා කළ හැකි විකල්ප ක්‍රම මොනවාද?

....................................................................................................

....................................................................................................

....................................................................................................

36.

| ගිණුම්කරණ තොරතුරුවල ගුණාත්මක ලක්ෂණ | ව්‍යාපාරයක ගිණුම්කරණ ක්‍රියාවලියන් කඩවීමකට ලක්විය හැකි අවස්ථා |
|---|---|
| අදාළත්වය | |
| විශ්වාසනීයත්වය | |

37. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට උපකාරී වන ''ප්‍රමාණාත්මකභාවය'' නමැති ලක්ෂණය හඳුන්වන්න.

....................................................................................................

....................................................................................................

38. ''ව්‍යාපාරයක් අත්පත් කරගත් වත්කමක් සෘජුවම ආදායම් ප්‍රකාශයට හර නොකර, කොටස් වශයෙන් ලාභයට එරෙහිව කපාහරී. එම කොටස ගිණුම්කරණයේ ''ක්ෂයවීම'' ලෙස හඳුන්වයි. වත්කමක ක්ෂයවීම තීරණය කරන සාධක 02 ක් දක්වන්න.

....................................................................................................

....................................................................................................

e තක්සලාව The National e-learning Portal for The General Education

39. ව්‍යාපාරයක ''නිෂ්පාදන පිරිවැය'' හා ''විකුණුම් පිරිවැය'' එකිනෙකට සමාන වන අවස්ථා 02 ක් දක්වන්න.

.......................................................................................................................................................

.......................................................................................................................................................

40. NN හවුල් ව්‍යාපාරයේ 2012. 03. 31 න් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු ලබා දී ඇත.

- 2011. 04. 01 දිනට — ප්‍රාග්ධන ගිණුම් ශේෂ වල එකතුව — රු. 418,000
  ජංගම ගිණුම් ශේෂ වල එකතුව — රු. 331,000
- 2012. 03. 31 දිනට — ප්‍රාග්ධන ගිණුම් ශේෂ වල එකතුව — රු. 568,000
  ජංගම ගිණුම් ශේෂ වල එකතුව — රු. 410,000

- හවුල්කරුවන් විසින් වසර තුළ දී අතිරික්ත ප්‍රාග්ධනය යොදවා ඇතත් එය නිවැරදිව ගිණුම්ගත කර ඇත. (මේ හැර ස්ථාවර ප්‍රාග්ධනයෙන් නොමැත.)

- හවුල්කරුවන් වසර තුළ සිදුකළ මුළු ගැනිලි ප්‍රමාණය රු. 295,000 ක් වුවත් පොත්වල එය රු. 395,000 ක් ලෙසට සටහන් කර ඇත.

2011/2012 වර්ෂයේ හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය කොපමණ ද?

.......................................................................................................................................................

.......................................................................................................................................................

41. පහත එකිනෙක ගිණුම් කුමන ගිණුම්කරණ මූලිකාංගයට අයත් වන්නේ ද යන්න දක්වන්න.

A - ආදායම් බදු වෙන් කිරීම ..................................................

B - ගැණුම් ..................................................

C - ක්ෂය වෙන්කිරීම් ..................................................

D - ගැනිලි ..................................................

42. පහත සඳහන් ක්ෂේත්‍රවලට අදාළව කළමනාකරණ ගිණුම්කරණය සහ මූල්‍ය ගිණුම්කරණය අතර වෙනස්කම් ලියා දක්වන්න.

| ක්ෂේත්‍රය | කළමනාකරණ ගිණුම්කරණය | මූල්‍ය ගිණුම්කරණය |
|---|---|---|
| 01. අවධානයට යොමු වන කාලය | | |
| 02. වාර්තා කිරීමේ වාර ගණන | | |
| 03. භාවිතාකරන පාර්ශවය | | |
| 04. පොදුවේ පිළිගත් මූලධර්ම | | |

43. හවුල්කරුවෙකු ලෙස හවුල් ව්‍යාපාරයට දායකත්වය ලබාදිය හැකි ප්‍රධාන ආකාර 03 ක් නම්කර එම දායකවීම් වලට ලැබෙන ප්‍රතිලාභ ඒ ඒ දායකවීම ඉදිරියෙන් ලියන්න.

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

The National e-learning Portal for The General Education

44. සීමිත රන්සර සමාගම සඳහා 2015 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් විස්තර ඔබට සපයා ඇත.

| | රු. |
|---|---|
| අමුද්‍රව්‍ය තොගයේ අඩු වීම | 75,000 |
| අමුද්‍රව්‍ය මිලට ගැනීම | 810,000 |
| මිලට ගැනීම ආපසු යැවීම අමුද්‍රව්‍ය | 40,000 |
| ගෙන යෑමේ කුලිය | 64,000 |
| ගෙන ඒමේ කුලිය | 37,500 |
| සෘජු වේතන | 371,500 |
| නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | 214,600 |
| නොනිමි වැඩ වල වැඩි වීම | 29,400 |
| ලැබුණු වට්ටම් | 16,000 |

නිෂ්පාදන පිරිවැය කොපමණ ද?

........................................................................................................................................................

........................................................................................................................................................

45. ව්‍යාපාරයක් 2014. 04. 01 දින මිලට ගත් යන්ත්‍රයක ඵලදායි ජීවිත කාලය වර්ෂ 10 ක් ද, පිරිවැය 200,000 ක් ද, සුන්බුන් අගය 20,000 ක් ද විය. 2014. 10. 01 දින ඉහත යන්ත්‍රයට එකතු කළ 40,000 ක් වටිනා කොටසක් හේතුවෙන් එහි කාර්යක්ෂමතාවය වැඩි වී ඇත. මෙම විශේෂ කොටසේ ඵලදායි ජීවිත කාලය වර්ෂ 05 කි. 2015 . 03. 31 දිනට යන්ත්‍රයේ ධාරණ වටිනාකම කීයද?..................................................................

46. අඩමාන ණය වෙන්කිරීම කෙරෙහි ''ගැලපුම් සංකල්පය'' අදාළ වන ආකාරය පැහැදිලි කරන්න.

........................................................................................................................................................

........................................................................................................................................................

........................................................................................................................................................

47. පිරිවැය හා වියදම අතර වෙනස කුමක් ද?

........................................................................................................................................................

........................................................................................................................................................

........................................................................................................................................................

48. ගිණුම්කරණය ''සමාජ සංසිද්ධියක්'' වේ. ගිණුම්කරණය සමාජ සංසිද්ධියක් වන්නේ කුමන කරුණු මතද යන්න පෙන්වන්න..........................................................................................................................

........................................................................................................................................................

49. ජංගම වත්කම් යන්න ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව නිර්වචනය කරන්න.

........................................................................................................................................................

........................................................................................................................................................

........................................................................................................................................................

50. මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවේ වැඩිදියුණු කිරීමේ ගුණාත්මක ලක්ෂණ 04 සඳහන් කරන්න. ..........................................................................................................................................

........................................................................................................................................................

........................................................................................................................................................

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## ගිණුම්කරණය - II

**12 ශ්‍රේණිය**

**කාලය පැය 03 යි.**

උපදෙස් :-

- පළමුවන හා දෙවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 06 කට පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම පිළිතුරු ලිවීමේදී අළුත් කඩදාසියකින් ආරම්භ කරන්න.
- අදාළ පෙරවැඩ පිළිතුරු පත්‍රය සමග අමුණන්න.

---

01. රංග හා අසේල පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයේ හවුල් ගිවිසුම පහත පරිදි වේ.

(1) සංගාට මාසයකට රු. 3,000 ක් හා මහේලට රු. 4,000 ක් වශයෙන් මාසික වේතන ගෙවිය යුතුය.

(2) ප්‍රාග්ධන ශේෂ මත පොළී 20% කි.

(3) ඉතිරි ලාභය පිළිවෙලින් 3:2 අනුපාතයට බෙදා ගත යුතුය.

2014 මාර්තු 31 දින මෙම ව්‍යාපාරයේ මුල්‍යතත්ව ප්‍රකාශය පහත දැක්වේ.

| ජංගම නොවන වත්කම් | පිරිවැය | සමුච්ඡය | ශුද්ධ අගය |
|---|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 3,000 | 200 | 2,800 |
| ලී බඩු හා උපකරණ | 1,000 | 200 | 800 |
| මෝටර් රථ | 1,500 | 300 | 1,200 |
| | 5,500 | 700 | 4,800 |
| ජංගම වත්කම් | | | |
| තොග | | 300 | |
| ණයගැතියෝ | 200 | | |
| අඩමාණ ණය වෙන්කිරීම් | (20) | 180 | |
| ඉදිරියට ගෙවූ පරිපාලන වියදම් | | 20 | |
| බැංකු හා මුදල් | | 100 | 600 |
| මුළු වත්කම් | | | 5400 |
| ප්‍රාග්ධන රංග | | 2,000 | |
| අසේල | | 1,000 | 3,000 |
| ජංගම ගිණුම් රංග | | 200 | |
| අසේල | | 300 | 500 |
| ජංගම නොවන වගකීම් | | | |
| 10% බැංකුණය | | | 1,200 |
| ජංගම වගකීම් | | | |
| ණයහිමියෝ | | 500 | |
| උපචිත වියදම් (බෙදාහැරීම් වියදම්) | | 100 | |
| ඉදිරියට ලද කුලී | | 100 | 700 |
| | | | 5,400 |

2015 මාර්තු 31 දිනෙන් අවසන් වසරේ මූලික පොත් වලින් උපුටාගත් තොරතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| ලැබීම් ජ'නලයේ විශ්ලේෂණය | රු. 000 |
| අත්පිට විකුණුම් | 800 |
| ණයගැති ලැබීම් | 5400 |
| කුලී ලැබීම් | 700 |
| රංග 2014.10.01 යෙදූ අමතර ප්‍රාග්ධනය | 1000 |
| මෝටර් රථ විකිණීමෙන් | 400 |
| මුළු ලැබීම් | 8300 |
| | |
| ගෙවීම් ජ'නලයේ විශ්ලේෂණය | |
| අත්පිට ගැණුම් | 400 |
| ණයහිමියන්ට ගෙවීම් | 3,100 |
| බෙදාහැරීම් වියදම් | 800 |
| පරිපාලන වියදම් | 1,200 |
| මූල්‍ය වියදම් (ණය පොලී) | 60 |
| වෙනත් වියදම් | 40 |
| 2014.07.01 ලී බඩු උපකරණ මිලට ගැනීම් | 400 |
| ගැනිලි රංග | 800 |
| අසේල | 600 |
| මුළු ගෙවීම් | 7,400 |
| ලැබීම් ජ'නලයේ වට්ටම් තීරුවේ එකතුව | 100 |
| ගෙවීම් ජ'නලයේ වට්ටම් තීරුවේ එකතුව | 200 |
| | |
| ගැනුම් ජ'නලයේ එකතුව | 3,000 |
| විකුණුම් ජ'නලයේ එකතුව | 6,000 |
| ආපසු එවුම් ජ'නලයේ එකතුව | 200 |
| ආපසු යැවුම් ජ'නලයේ එකතුව | 100 |

අතිරේක තොරතුරු

(1) 2015 03 31 දිනට භෞතික තොගය රු. 400,000 කි.

(2) ඉඩම් වල පිරිවැය රු. 2,000,000 කි. ගොඩනැගිලි 5% ක් ද, අනෙකුත් දේපළ පිරියත හා උපකරණ 10% ක් ද පිරිවැය මත ක්ෂය කෙරේ.

(3) 20130401 දින රු. 500,000 කට මිලදී ගෙන තිබූ වාහනයක් 20141231 දින විකුණන ලදී.

(4) රු. 40,000 ක් බොල්ණය ලෙස කපා හැර ණය ගැතියන්ගෙන් 10% ක් අඩමාන ණය වෙන්කිරීමක් පවත්වාගෙන යා යුතුය.

(5) රු. 100,000 භාණ්ඩ ණයට ලබාගෙන ඇතත් 2015 මාර්තු 31 දින වන විටත් මේවා ව්‍යාපාරයට ලැබී නැත.

(6) කුලී රු. 300,000 ක් ලැබිය යුතුව ඇත. තවද රු. 300,000 ක රක්ෂණ ගාස්තු ඉදිරි වර්ෂය වෙනුවෙන් ගෙවා ඇත.

(7) මාර්තු මාසයේ බැංකු විස්තරයේ සඳහන් බැංකු ගාස්තු රු. 10,000 ක් සහ චෙක්පොත් ගාස්තු රු. 10,000 ක් සම්බන්ධයෙන් සටහන් තබා නැත.

(8) අර්ථසාධක වියදම් රු. 60,000 ක් උපචිත වේ.

අවශ්‍ය වන්නේ,

(1) 2015 03 31 දිනෙන් අවසන් වසර සඳහා මෙම ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශය.

(2) හවුල් කරුවන්ගේ ජංගම ගිණුම

(3) 20150331 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (ල. 20)

02. (අ) පහත සඳහන් ගණුදෙනු සහ සිද්ධීන් 2015 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමකට අදාළ වේ.

| දිනය | ගණුදෙනු සහ සිද්ධීන් |
|---|---|
| 2014/04/01 | මෙදිනට පිරිවැය රු. 360,000ක් හා සමුච්චිත ක්ෂය රු. 160,000 ක් වූ ගොඩනැගිල්ලකට රු. 120,000 ක් වැය කරමින් ව්‍යුහාත්මක වෙනස්කම් සිදුකරන ලදී. මෙමගින් එහි ආරම්භක අපේක්ෂිත ජීවකාලය වූ වර්ෂ 30 වර්ෂ 36 දක්වා දීර්ඝ වී ඇත. කෙසේ නමුත් ගොඩනැගිල්ලේ සුන්බුන් අගය වූ රු. 60,000 ව්‍යුහාත්මක වෙනසින් පසුවද නොවෙනස් ව පවතී. |
| 2014/07/01 | රු. 900,000 ක් පිරිවැය වූ සමාගමේ ඉඩම් කට්ටයක් අධි තාක්ෂණ යන්ත්‍රයකට හුවමාරු කරන ලදී. එදිනට මෙම යන්ත්‍රයේ සහ ඉඩමෙහි සාධාරණ අගය රු. 1,000,000 බැගින් විය. යන්ත්‍ර සූත්‍ර පිරිවැය මත වර්ෂයකට 20% ක් ක්ෂය කරනු ලැබේ. |
| 2014/10/01 | 2014/03/31 දිනට පිරිවැය රු. 1,000,000 ක් වූ සහ සමුචිත ක්ෂය රු. 300,000 ක් වූ උපකරණයක් රු. 60,000 කට ප්‍රත්‍යාගණනය කරන ලදී. උපකරණ වාර්ෂිකව 25% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ. |
| 2015/01/01 | රු. 300,000 කට මිලදී ගෙන තිබූ යන්ත්‍රයක් රු. 25,000 කට විකුණන ලදී. 2014/03/31 දිනට මෙම යන්ත්‍රයේ සමුච්චිත ක්ෂය රු. 300,000 ක් විය. |

The National e-learning Portal for The General Education

අවශ්‍ය වන්නේ

01. ඉහත ගණුදෙනුවල ට අදාළව 2015/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු ක්ෂය ප්‍රමාණය

02. ඉහත ගණුදෙනු නිසා වර්ෂයේ ලාභය වැඩි හෝ අඩු වූ ප්‍රමාණය

03. 2014/10/01 සහ 2015/01/01 දින සිදු වූ ගනුදෙනු නිසා 2015 මාර්තු 31 දිනට යන්ත්‍ර හා උපකරණවල ධාරණ වටිනාකම වැඩි වූ හෝ අඩු වූ ප්‍රමාණය

04. ඉහත ගණුදෙනු නිසා වර්ෂය තුළදී මුදල් ශේෂය වැඩි වූ හෝ අඩු වූ ප්‍රමාණය (ල. 10)

(ආ) මාලිංග ව්‍යාපාරයේ ගිණුම් තැබීමේදී පහත සඳහන් වැරදි සිදු වී ඇත.

(1) රු. 15,000 ක් සචින්ගෙන් ණයට ගැණුම් ඉන්වොයිසියක් ගැණුම් ජ'නලයේ සටහන් කර ඇත්තේ රු. 1,500 ක් ලෙස වන අතර ගැණුම් ජ'නලයේ එකතුව 1,000 ක් වැඩියෙන් ගණන් ගෙන ඇත.

(2) සේවක අර්ථ සාධක අරමුදල් සේව්‍ය දායකය 12% හා සේවක දායකය 8% යන දෙකම වෙනුවෙන් රු. 24,000 ක් අර්ථ සාධක අරමුදල් වියදම් ගිණුමට හර කර ඇත.

(3) රු. 3,000 බොල්ණය කපාහැරීමක් අදාළ ණයගැති ගිණුමට හර කර ඇත.

(4) රු. 8,000 ක ණයහිමියෙකු වූ අමල්ට වට්ටම් කාලය තුළ මුදල් ගෙවා 10% ක් වූ වට්ටම අඩුකර නොගෙන මුළු මුදලම ගෙවා ඇත.

(5) රු. 100,000 ක භාණ්ඩ ඇණවුම් කර රු. 10,000 ක අත්තිකාරමක් ගෙවා ඇත. ගෙවූ අත්තිකාරම් ගැණුම් ගිණුමට හර කර ඇති අතර අදාළ ඇණවුම සඳහා භාණ්ඩ සැපයීය නොහැකි බව සැපයුම්කරු විසින් දන්වා ඇත.

(6) කල්ගත වූ ණය ගැතියන් වෙනුවෙන් අයකළ යුතු රු. 2,000 ක පොළිය අදාළ ණයගැති ගිණුමට බැර කර පොළී ගිණුම හර කර ඇත.

අවශ්‍ය වන්නේ

(1) වැරදි නිවැරදි කිරීම සඳහා ජ'නල් සටහන්.

(2) වැරදි නිවැරදි කිරීමෙන් ලාභයට හෝ අලාභයට වන බලපෑම පෙන්නුම් කරන ලේඛනයක් (ල. 10)

(මුළු ලකුණු 20)

03. සුමනසිරි සමාගමේ පොත් තබන්නා මහජන බැංකුවේ ගිණුම් අංක 1033571 ට අදාළව 2015.03.31 දින පිළියෙල කළ බැංකු සැසඳුම් ප්‍රකාශය පහත දැක්වේ.

| | | | | |
|---|---|---|---|---|
| | | රු.000 | | |
| බැංකු ප්‍රකාශයට අනුව ශේෂය | | 127,965 | | |
| එකතු : තැන්පත් කළ නමුත් උපලබ්ධි වී නැති චෙක්පත් | | | | |
| 15.03.04 | කමල් සමාගම | 10,000 | | |
| 15.03.09 | නිමල් සමාගම | 4,978 | | |
| 15.03.20 | පියල් සමාගම | 6,462 | | |
| 15.03.30 | අනිල් සමාගම | 3,150 | 24,590 | |
| | | | 152,555 | |
| අඩුකළා: ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කර නැති චෙක්පත් | | | | |
| 15.02.29 | චෙක් අංක | 000420 | 480 | |
| 15.03.20 | චෙක් අංක | 000445 | 765 | |
| 15.0324 | චෙක් අංක | 000448 | 1,600 | |
| 15.03.31 | චෙක් අංක | 000450 | 1,115 | (3,960) |
| බැංකු ගිණුමට අනුව බැංකු ශේෂය | | | | 148,595 |

2015 අප්‍රේල් මාසය අවසාන වන විට ව්‍යාපාර මුදල් පොතේ බැංකු ගිණුමත්, බැංකුව මගින් එවන ලද බැංකු ප්‍රකාශයත් පහත පරිදි විය.

| දිනය | විස්තරය | මුදල රු | දිනය | විස්තරය | මුදල රු |
|---|---|---|---|---|---|
| 15.04.01 | ශේෂය ඉ/ගෙ | 148,595 | | නිකුත් කළ චෙක්පත් | |
| 15.04.09 | මුදල් තැන්පත් | 12,580 | 15.04.05 | 00451 | 14,210 |
| 15.04.12 | චෙක්පත් තැන්පත් | 3,970 | 15.04.14 | 00452 | 3,120 |
| 15.04.15 | චෙක්පත් තැන්පත් | 1,510 | 15.04.16 | 00453 | 1,680 |
| 15.04.18 | මුදල් තැන්පත් | 6,190 | 15.04.20 | 00454 | 952 |
| 15.04.23 | චෙක්පත් තැන්පත් | 10,260 | 15.04.26 | 00455 | 1,960 |
| 15.04.28 | චෙක්පත් තැන්පත් | 11,500 | 15.04.29 | 00456 | 7,120 |
| | | | 15.04.30 | ශේෂය ප/ගෙ | 175,563 |
| | | 204,605 | | | 204,605 |
| 15.05.01 | ශේෂය ඉ/ගෙ | 175,563 | | | |

The National e-learning Portal for The General Education

2015 අප්‍රේල් මාසය සඳහා බැංකුව එවා ඇති මාසික ප්‍රකාශය පහත දැක්වේ.

| දිනය | විස්තරය | හර | බැර | ශේෂය |
|---|---|---|---|---|
| 15.04.01 | ශේෂය ඉ/ගෙ | | | 127,965 |
| 15.04.03 | තැන්පත් චෙක් | | 6,462 | 134,427 |
| | චෙක් 000445 | 765 | | 133,662 |
| 15.04.07 | චෙක් 000450 | 1,115 | | 132,547 |
| | චෙක් 000451 | 14,210 | | 118,337 |
| 15.04.09 | තැන්පත් චෙක් | | 3,150 | 121,487 |
| | තැන්පත් මුදල් | | 12,580 | 134,067 |
| 15.04.13 | තැන්පත් චෙක් | | 3,970 | 138,037 |
| 15.04.18 | තැන්පත් මුදල් | | 6,190 | 144,227 |
| | චෙක් 000452 | 3,120 | | 141,107 |
| | චෙක් 000453 | 1,680 | | 139,427 |
| 15.04.25 | තැන්පත් චෙක් | | 10,260 | 149,687 |
| 15.04.29 | චෙක් 000454 | 752 | | 148,935 |
| 15.04.30 | ස්ථාවර තැන්පත් පොලිය | | 1,575 | 150,510 |
| | ස්ථාවර නියෝග රක්‍ෂණ වාරිකය | 1,200 | | 149,310 |
| | බැංකු ගාස්තු | 430 | | 148,880 |

The National e-learning Portal for The General Education

සටහන 1. බැංකු ගිණුමේ හර පැත්ත එකතු කිරීමේ වරදක් තිබෙන බව පසුව හෙළිවිය.

2. 15.04.20 නිකුත් කර ඇති චෙක්පත් අංක 000454 නිවැරදි අගය රු. 752 කි.

2015 අප්‍රේල් 30 දිනට සංශෝධිත බැංකු ගිණුම පිළියෙල කොට, බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කරන්න.

(ල. 15)

04. අමරගේ ව්‍යාපාරයේ 2014.04.01 දින සකස් කර ඇති මූල්‍යතත්ව ප්‍රකාශය පහත දැක්වේ.

**අමර ව්‍යාපාරය**
**2014 - 04 - 01 දිනට**
**ශේෂ පත්‍රය**

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රාග්ධනය | 150,000 | ඉඩම් | | 100,000 |
| + ලාභය | 20,000 | ගොඩනැගිලි | 150,000 | |
| ගැනිලි | (10,000) | සමුච්චය | (30,000) | 120,000 |
| | 160,000 | | | |
| | | ජංගම වත්කම් | | |
| දිගුකාලීන වගකීම් | | භාණ්ඩ තොග | 40,000 | |
| බැංකු ණය | 100,000 | ණයගැති | 20,000 | |
| | | මුදල් | 20,000 | 80,000 |
| ජංගම වගකීම් | | | | |
| ණයහිමියෝ | 40,000 | | | |
| | 300,000 | | | 300,000 |

**2014 අප්‍රේල් මාසය තුළදී පහත ගණුදෙනු සිදුවී ඇත.**

(1) රු. 50,000 ක භාණ්ඩ රු. 10,000ක් මුදල් ගෙවා ලබාගෙන ඇත.
(2) රු. 40,000 ක භාණ්ඩ රු. 20,000 ක ලාභයක් තබාගෙන මුදලට විකුණා ඇත.
(3) රු. 20,000 ක භාණ්ඩ රු. 10,000 ක ලාභයක් තබාගෙන විකුණා ඇත. මෙම විකුණුම් සඳහා මුදලින් රු. 10,000 ක් ලබාගෙන ඇත. ඉතිරිය පසුව ලබාදීමට පොරොන්දු වී ඇත.
(4) ණයහිමියන්ට රු. 27,000 ක් මුදලින් ගෙවා ඇත. එහිදී 10% ක වට්ටමක් ලැබී ඇත.
(5) ණයගැතියන්ගෙන් රු. 28,500 ක් ලැබී ඇත. මෙහිදී ඔවුන්ට 5% ක වට්ටමක් ලබා දී ඇත.
(6) ව්‍යාපාරය රු. 2,000 ක් සේවක වැටුප් ලෙස ගෙවා ඇත.
(7) ව්‍යාපාරයේ ඉඩම රු. 105,000 කට ප්‍රත්‍යාගණනය කර ඇත.
(8) රු. 2,000 ක මාසයේ විදුලි බල ව්‍යාපාරයට ලැබී ඇත.
(9) රු. 15,000 ක භාණ්ඩ රු. 20,000 කට විකුණා ඇත. මිලදී ගත් තැනැත්තා රු. 20,000 පියවීම සඳහා රු. 19,000 ක් වටිනා ලී බඩු උපකරණ ව්‍යාපාරයට ලබා දී ඇත. (මෙම ගණුදෙනුව සිදුවී ඇත්තේ මාසයේ අවසාන දින වේ.)
(10) ව්‍යාපාරයේ ස්ථාවර වත්කම් පිරිවැය මත 10% ක් වාර්ෂිකව ක්‍ෂය කරනු ලබයි.

අවශ්‍ය වන්නේ,

(අ) ඉහත තොරතුරු පහත ගිණුම් සමීකරණයේ ඇතුලත් කරන්න.
ජංගම වත්කම් + ජංගම නො. වත්කම් = ජංගම වගකීම් + ජංගම නො. වගකීම් + හිමිකම්
(ආ) ඉහත (7) , (8) , (9) , (10) ගණුදෙනු සටහන් කිරීමට අදාළ උපයෝගී පොත් වෙන වෙනම ලියන්න.
(ඇ) (7), (8), (9) ගණුදෙනු වලට අදාළ ද්විත්ව සටහන් ලියන්න.
(ඈ) ශුද්ධ වත්කම් පදනම මත මාසයේ ශුද්ධ ලාභය ගණනය කරන්න.
(ඉ) 2014. 04. 30 දිනට ශේෂ පත්‍රය සකස් කරන්න. (ල. 15)

05. ගගනි ව්‍යාපාරයේ ණයගැතියන් හා ණයහිමියන් ආශ්‍රිතව සිදුවී ඇති 2014 ජනවාරි මස ගණුදෙනු සාරාංශයක් පහත දැක්වේ.

(රු.'000)

| නම | විකුණුම් (රු. '000) | ආපසු එවුම් | දුන් වට්ටම් ප්‍රතිශතය | ලද ශුද්ධ මුදල් | ආරම්භක ශේෂය |
|---|---|---|---|---|---|
| නිලානි | 7,000 | 300 | 10% | 2,700 | 2,200 |
| කුසුමා | 3,200 | | 5% | 1,425 | 1,800 |
| නිපුන් | 1,000 | 200 | | 1,000 | (100) |

(රු.'000)

| නම | ගැණුම් | ආපසු යැවුම් | ලද වට්ටම් | ගෙවූ ශු. මුදල් | ආරම්භක ශේෂය |
|---|---|---|---|---|---|
| අයේෂ් | 1,200 | 200 | | 800 | 600 |
| ඩිලාන් | 2,000 | 100 | 5% | 2,375 | 700 |
| ඉසංකා | 500 | 10 | 10% | 540 | 300 |

National e-learning Portal for The General Education

ඉහත ගණුදෙනු සටහන් කිරීමේදී පොදු ලෙජරය තුළ පහත වැරදි සිදුවී ඇත.

(1) විකුණුම් ජ'නලයේ එකතුව රු. 12,100,000 ක් ලෙස ලෙජරයට පිටපත් කර ඇත.

(2) නිපුන්ගේ අවසාන බැර ශේෂය පාලන ගිණුමට ගෙනගොස් නැත.

(3) කුසුමාට දුන් වට්ටම් ඇයගේ ගිණුමට හර කර ඇත.

(4) ලැබීම් මුදල් පොතේ ඇතුලත් වට්ටම් තීරුවේ එකතුව ණයහිමි පාලන ගිණුම හරකර ලද වට්ටම් ගිණුම බැර කර ඇත.

(5) ඩිලාන්ට ආපසු යැවුම් ඔහුගේ ගිණුමෙන් මඟහැරී ඇත.

(6) ආපසු යැවුම් ජ'නලයේ එකතුව ලෙජරයට පිටපත් කිරීමේ දී රු. 100,000 ක් වැඩියෙන් පිටපත් කර තිබේ.

(7) ඉසංකාගේ ගිණුමට ලද වට්ටම් දෙවරක් ඇතුලත් කර ඇත.

(8) කුසුමාගේ රු. 200,000 ක් බොල්ණය ලෙස කපාහැර ඇතත් එය ඇයගේ ගිණුමේ නැත.

**අවශ්‍ය වන්නේ,**

(1) ඉහත වැරදි සංශෝධනයට පෙර ණයගැති පාලන ගිණුම

(2) නිවැරදි ණයගැති ශේෂ ලැයිස්තුව

(3) ණයහිමි සැසඳුම් ප්‍රකාශය

(4) සංශෝධිත ණයගැති පාලන ගිණුම

(5) ඉහත වැරදි වලට පෙර ශුද්ධ ලාභය රු. 1,825,000 ක් නම්, නිවැරදි ශුද්ධ ලාභය සොයන්න.

(ල. 15)

06. (අ) 2014. 03. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා "Complete Table" නිෂ්පාදනය කරන ආයතනයකට අදාළ පහත තොරතුරු ඔබට සපයයි.

- නිෂ්පාදනය කළ Table 1000
- විකුණූ Table - 900
- පාවිච්චි කළ මුළු ලී ප්‍රමාණය 6000 (වර්ග මීටර්)
- Table එකක් සඳහා වඩු කාර්මික ශ්‍රමය රු. 3 610
- වාර්ෂික පොදුකාර්ය

| | |
|---|---|
| නිෂ්පාදන | රු. 400,000 |
| නිෂ්පාදන නොවන | රු. 200,000 |

- FIFO ක්‍රමයට ලී භාවිතා කරයි.
- 2013. 04. 01 තොග,

  $1m^2$ රු. 400 බැගින් 100 $m^2$

  රු. 5200 ක් නිෂ්පාදන පිරිවැය Table 80
- වර්ෂය තුළ රු. 500 බැගින් රු. 6,150 $m^2$ ලී මිලට ගෙන ඇත.
- 14. 03. 31 දින ලී 50 $m^2$ සොරාගෙන ඇති අතර ඒ සඳහා 75% ක රක්ෂණ වන්දියක් ලැබීමට නියමිතය.
- මේසයක විකුණුම් මිල රු. 10,000 කි.

**අවශ්‍ය වන්නේ,**

(1) මුළු නිෂ්පාදන පිරිවැය

(2) ඒකක පිරිවැය

(3) 14. 03.31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

(4) හානි වූ ලී ගැලපීම් සඳහා ජ'නල් සටහන්.

(ආ) භාතිය ගඩොල් නිෂ්පාදන ව්‍යාපාරයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ තොග සම්බන්ධව පහත තොරතුරු අනාවරණය කරයි.

(1) 2014 දෙසැම්බර් 31 දිනට භෞතික තොගය 250,000

(2) 2014 නොවැම්බර් 01 දින නියෝජිතයන් වෙත යවන ලද භාණ්ඩ වල වටිනාකම පිරිවැය රු. 100,000 කි. මින් 50% ක භාණ්ඩ විකුණා ඇත. කිසිවක් තොග වලට ගෙන නැත.

(3) 2014 සැප්තැම්බර් 01 දින විකිණීම හෝ ආපසු එවීමේ පදනම යටතේ 160,000 ක විකුණුම් මිල වූ භාණ්ඩ තොගයක් යවා ඇත. 2014 දෙසැම්බර් 31 වන විට මින් 60,000 ක විකුණුම් මිල වූ භාණ්ඩ විකුණා ඇත. විකුණුම් මිල නියම කර ඇත්තේ විකුණුම් මිලට 20% ක ලාභයක් ලැබෙන පරිදිය. මේ පිළිබඳව කිසිවක් තොග වලට ගෙන නැත.

(4) තොග තුළ ඇතුලත් පිරිවැය රු. 60,000 ක් වූ තොග සුළු වශයෙන් හානි වී ඇති අතර එය රු. 45,000 කට පමණ විකිණිය හැකි බව ඇස්තමේන්තු කරයි.

(5) තොග තුළ රු. 10,000 ක පිරිවැය කල් ඉකුත් වූ තොග ඇතුලත්ව ඇත.

(6) ව්‍යාපාරයේ පරිපාලන කටයුතු වලට ගෙන ඇති රු. 15,000 ක ලිපිද්‍රව්‍ය තොගයක් ද ඉහත තොගවල ඇතුලත්ය.

(7) සැපයුම්කරුවන්ගෙන් ලද සාම්පල් තොගයක් රු. 20,000 ක පිරිවැයකට තොගයට ගෙන ඇත.

(8) තොග වාර්තා එකතු කිරීමේ දී විකිණීමේදී රු. 10,000 අඩුවෙන් එකතු කර තිබුණි.

**අවශ්‍ය වන්නේ,**

2014 දෙසැම්බර් 31 දිනට තොග වටිනාකම ගණනය කරන්න.

(මුළු ලකුණු 15)

07. (අ) සිංහ ක්‍රීඩා සංගමයේ භාණ්ඩාගාරික විසින් 2015 දෙසැම්බර් 31 දිනෙන් සහ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

ආදායම් ප්‍රකාශය

| | 2015 | 2014 |
|---|---|---|
| ආදායම | රු. | රු. |
| සාමාජික මුදල් | 13,000 | 12,500 |
| පරිත්‍යාග මුදලින් | 13,000 | 2,000 |
| ආයෝජන ආදායම් | 2,000 | |
| | 28,000 | 14,500 |
| අඩුකළා වියදම් | | |
| පුවත්පත් | 1,500 | 1,000 |
| සේවක වේතන | 5,000 | 4,500 |
| ලිපිද්‍රව්‍ය | 1,000 | 1,500 |
| වාර්ෂික ක්‍රීඩා තරග වියදම් | 3,000 | 5,000 |
| ක්‍රීඩා උපකරණ ක්ෂය | 3,000 | 2,000 |
| අතිරික්තය | 14,500 | 500 |

දෙසැම්බර් 31 දිනට මූල්‍යතත්ත්ව ප්‍රකාශය

| | 2015 | 2014 |
|---|---|---|
| ජංගම නොවන වත්කම් | රු. | රු. |
| ක්‍රීඩා උපකරණ | 27,000 | 18,000 |
| | | |
| ආයෝජන | 11,000 | |
| ජංගම වත්කම් | | |
| ලිපිද්‍රව්‍ය තොගය | 3,000 | 500 |
| ලැබිය යුතු සාමාජික මුදල් | 7,000 | 2,500 |
| ලැබිය යුතු ආයෝජන ආදායම් | 2,000 | |
| බැංකු ශේෂය | | 9,000 |
| | 50,000 | 30,000 |
| ජනවාරි 01 දිනට සමුච්චිත අරමුදල | 25,000 | 24,500 |
| එකතු කළා | | |
| වර්ෂයේ අතිරික්තය | 14,500 | 500 |
| උපචිත ක්‍රීඩා තරග වියදම් | | 2,000 |
| ඉදිරියට ලද සාමාජික මුදල් | 500 | 3,000 |
| බැංකු අයිරාව | 10,000 | |
| | 50,000 | 30,000 |

අවශ්‍ය වන්නේ,

(1) 2015 වර්ෂය සඳහා ලැබීම් හා ගෙවීම් ගිණුම

(2) 2015 වර්ෂයේ දී අතිරික්තය රු. 14,500 දක්වා වැඩි වී ඇතත් බැංකු ශේෂය රු. 10,000 ක අයිරාවක් බවට පත්වීමට හේතු විය හැකි ප්‍රධාන හේතු 02 ක් සඳහන් කරන්න.

(ආ)

පහත සඳහන් වගුවේ හිස්තැන් පුරවන්න.

| ලෙජර් ගිණුම | වර්ෂය තුළ ගෙවූ මුදල | ලාභාලාභ ගිණුම මාරු කිරීම | ජනවාරි 01 ශේෂය | දෙසැම්බර් 31 ශේෂය |
|---|---|---|---|---|
| (1) රක්ෂණය | 90,000 | ? | 3,000 (බැර) | 4,000 (බැර) |
| (2) ගෙවල් කුලී | 28,000 | ? | 5,000 (හර) | 9,000 (හර) |
| (3) ප්‍රචාරණය | ? | 32,000 | 4,000 (බැර) | 5,000 (හර) |
| (4) විදුලිය | 8,000 | 14,000 | 2,000 (බැර) | ? |
| (5) පොදු වියදම් | 19,000 | 23,000 | ? | 2,000 (බැර) |

(මුළු ලකුණු 15)